

# අධ්‍යාපනයේ හෙට දවස

6642

6642
808.51

-5 MAR 2002

# අධ්‍යාපනයේ හෙට දවස

6642
APR 2002

සජීවී ව ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්
විශ්ව ළමා දිනය නිමිත්තෙන්
අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක
කුමාරතුංග මැතිනිය ජාතික රූපවාහිනිය සමග
පැවැති සංවාදාත්මක සාකච්ඡාවෙන්
උපුටා ගන්නා ලදී.

ජනතාව ගෙන් නැගෙන ප්‍රශ්නවලට වරින් වර රූපවාහිනිය ඔස්සේ පිළිතුරු දීම ජනපතිනි සිරිතය. ඒ සිරිතට අනුව ජනපතිනිය 1998. 10. 08 දින ද රාත්‍රි 7.00ට රූපවාහිනියේ පෙනී සිටියා ය. එ දින විශේෂත්වයක් විය. විශ්ව ළමා දිනය නිමිත්තෙන් එ දින ප්‍රශ්න හා පිළිතුරු මෙ රට ළමා පරපුරට බලපාන කාරණා පිළිබඳ වීම ය, ඒ.

ටී. එම්. ජී. චන්ද්‍රසේකර මෙහෙය වූ වැඩ සටහනට මෙ රට ළමා පරපුර නියෝජනය කරමින් ජනපතිනියගෙන් ප්‍රශ්න විචාරීම සඳහා, බදුල්ල රූපවාහිනී මුතුහර ළමා සමාජයේ ඩිලාන් හේෂාන්ත දරුවා ද, මොරටුව රූපවාහිනි ළමා සමාජයේ ප්‍රියංකා දිල්හානි දැරිය ද සහභාගි වූ හ. ඊට අතිරේක ව දිවයිනේ විවිධ ප්‍රදේශවල ළමුන් ගෙන් ද දුරකතන මගින් ජනපතිනිය වෙත ප්‍රශ්න යොමු කෙරිණ.

මේ පොත් පිංච සැකැසී ඇත්තේ ඒ වැඩ සටහන ඇසුරෙනි.

පී. එම්. ජී. චන්ද්‍රසේකර : ගරු ජනාධිපති තුමියනි, ඔබ ජනාධිපතිතුමිය පමණක් නොවෙයි, මවක්. ඒ නිසා ළමුන් පිළිබඳව හොඳ වැටහීමක් ඔබ තුමියට තිබෙනව, ළමුන් ගේ ප්‍රශ්න ඔබ තුමියට වඩාත් හොඳින් තේරෙනවා. ඒ නිසා, ළමයින් පිළිබඳ බොහෝ සේ කතා බහ කෙරෙන මේ ළමා සතියේ ඔබතුමිය ගෙන් දැන ගන්න කැමැතියි, ළමයින් කෙරෙහි මොන වගේ දැක්මක් ද මේ රජයට තියෙන්නේ ?

ජනපතිනිය : දරුවන් වෙනුවෙන් ඉතා පැහැදිලි දර්ශනයක් අපට තියෙනව. ජනතාවගේ රජයක් හැටියට අපේ විශ්වාසය ජනතාවගේ වටිනා ම කොටස දරුවන් බවයි. අපේ රටේ අනාගතය භාර ගන්නට ඉන්නේ ඔවුන්. '94 රෙ අප රට භාර ගන්න වෙලාවෙ, කෙටියෙන් කිව්වොත්, මේ රටේ දරුවන්ට තිබුණෙ ඉතා ම දුක්ඛිත තත්ත්වයක් කියල කියන්න පුළුවන්. මා හිතන විධියට ඉතාමත් ම ප්‍රධාන වන්නේ දරුවන්ගේ අධ්‍යාපනය යි. ප්‍රාථමික අවදියේ ඉඳල විශ්ව විද්‍යාලය දක්වා තරුණ වයස වෙනකම් දරුවන් ලබා ගත යුතු දෙත්, දරුවන්ට ලබා දිය යුතු දේත් අධ්‍යාපන යි, හරියාකාර අධ්‍යාපනය යි.

මේ රටේ දරුවන් ලක්ෂ හතළිස් පහක් පාසල් අධ්‍යාපනය ලබනවා. ඒ කියන්නේ මේ රටේ ජනගහණයෙන් හතරෙන් එකක්. මේ දරුවන්ට අප ලබා දුන් අධ්‍යාපනය මොකක් ද ? විද්‍යාත්මක, කාර්මික පුහුණුවක් ලබා නොදෙන, පරිගණක වැනි නවීන මෙවලම් භාවිතයට හුරු නොකරන, නවීන ලෝකයේ රැකියාවලට අවශ්‍ය පුහුණුව ලබා නොදෙන, මේ රටේත් ඇති වී තිබෙන සමාජ, ආර්ථික හා සංස්කෘතික පෙරළියට මුහුණ දෙන්නට සූදානම් නොකරන අධ්‍යාපනයක්. මේ නිසා අප බලාපොරොත්තු වන්නේ

පාසල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පස්සෙ, සර්ව සම්පූර්ණ, සාර්ථක මිනිසුන් හැටියට අපේ දරුවන් සමාජයට යැවෙන අධ්‍යාපනයක් ලබා දෙන්න.

ඒ වාගේ ම දරුවන් පිළිබඳ අපේ අවධානය යොමු වූ තවත් වැඩ පිළිවෙළ රාශියක් තියෙනව.

පසුගිය වසර 20ක විතර කාලය ඇතුළත මේ රටේ ළමා අපචාර වර්ෂයෙන් වර්ෂයට වර්ධනය වෙමින් පවතිනව. මේ රටේ කුඩා ගැහැණු, පිරිමි දරුවන් ගණිකා වෘත්තියට යොදා ගන්න පුළුවන් කියල ලෝකයේ ප්‍රසිද්ධියක් තියෙනව. මේ ගැන කිසි කෙනෙක් කිසි ගානක් ගත්තෙ නෑ. ඒත් අප දැන් එය වැළැක්වීම සඳහා විශාල වැඩ පිළිවෙලක් ආරම්භ කරල තියෙනව.

ඒ වගේ ම මත්පැන් හා මත්කුඩු මේ රටේ දරුවන් තැලෙන පෙළෙන තවත් උවදුරක්. තාත්තල මත්පැන් හා මත්කුඩු පාවිච්චි කිරීමෙන් අම්මලාට හා දරුවනට ඇති වන පීඩාව විශාලයි. දුම්පානයත් ඒ වාගෙයි. මෙතෙක් මේවාට එරෙහි ව කිසි වැඩ පිළිවෙළක් තිබුණේ නෑ. අප දැන් ඒ ගැන විශේෂ වැඩ පිළිවෙළක් ආරම්භ කරල ක්‍රියාත්මකව පවතිනව. මත් පැන් පානය සම්පූර්ණයෙන් ම නැති කරන්න පුළුවන් වෙයි කියල මා කිව්වොත් මා හිතන්නෙ ඒක සිහිනයක්. ඒත් අධික ලෙස මත් පැන් පානය කිරීම පාලනය කරන්න පුළුවන් වෙයි. මත්කුඩු සහ ළමා අපචාරය බිංදුවට ම බැස්සවීමයි අපේ අරමුණ.

දුම් පානයත් අපේ වැඩිහිටියන් ගේ මෙන් ම දරුවන්ගේ ද සෞඛ්‍යයට ප්‍රශ්න ඇති කරන්නක්. ඒ ගැන ද අපේ දැඩි අවධානය යොමු වෙලා

තියෙනව. බේබදුකම හා දිවි නසා ගැනීම් අතින් අපේ රට ට පහු ගිය කාලෙ පළමු තැන ලැබිල තිබුණ. දැන් එය හතර වැනි තැනට බැහැල. අපේ අදහස ඒක සම්පූර්ණයෙන් ම නැති කරන්න.

අනිත් කාරණය මන්දපෝෂණය. මන්දපෝෂණය වසරින් වසර ම වැඩි වීමට රටේ පවතින දුප්පත්කම හේතු වෙලා තියෙනවා. 1977 දී හාල් පොත අහෝසි කළාට පස්සේ අවුරුදු දෙක තුනක ඉඳල මන්ද පෝෂණය මර්දනය වෙන්න පටන් අරගෙන තියෙනව. මන්දපෝෂණයට එරෙහි ව අප ඊයේ පෙරේදා වැඩ පිළිවෙළක් ආරම්භ කළා.

මේ රටේ දරුවන්ට ආදරේ ඇති, දරුවන්ට ලෙන්ගතු රජයක් හැටියට දරුවන් වෙනුවෙන් අප කරල තියෙන දෙවල් ඒ. මේවායේ ප්‍රතිඵල ලැබෙන්නේ ඉදිරි වර්ෂවල. දෙදාහ – දෙදාස් තුන විතර වෙන කොට මේ වැඩපිළිවෙළවල වාසි මේ රටේ සියලු ම දරුවන්ට දැක බලා ගන්න පුළුවන් වෙයි. ඒ වන විට, අපේ වටිනා දරු සම්පතට ආසියාවේ පමණක් නොවෙයි, ලෝකයේ ම වටිනා ම දරු පරපුරක් හැටියට නව සියවසට පා තබන්න පුළුවන් වෙයි කියලයි මා හිතන්නෙ.

දුරකථනය මගින් ප්‍රශ්නයක් : ගරු ජනපතිතියනි, මා අනුරාධපුරෙන් කතා කරන්නේ. දැන් පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීමෙන් රජය බලාපොරොත්තු වන්නේ කුමක් ද ? මෙයින් ප්‍රයෝජනයක් වෙයි ද ? ඉදිරියේ දී විශ්ව විද්‍යාල ප්‍රවේශයට ලැස්ති වෙන ශිෂ්‍යයනට දැන් පවතින අධ්‍යාපන ක්‍රමය වෙනස් කිරීමෙන් අසාධාරණයක් සිදු වෙයි ද ?

ජනපතිතිය : ඉතා වටිනා ප්‍රශ්නයක්. මෙය මේ රටේ සියලු ම දරුවන් ගේ සිතට නැගෙන ප්‍රශ්නයක් වෙන්න ඕනැ. අධ්‍යාපන

ප්‍රතිසංස්කරණයෙන් අප බලාපොරොත්තු වන්නේ කුමක් ද ? යන්න මා කලිනුත් කෙටියෙන් සඳහන් කළා.

අප ඉගෙන ගත්ත කාලේ වගේ නොවෙයි දැන්. ලෝකය ඉතාමත් සංකීර්ණයි. දිනෙන් දින අලුත් ප්‍රශ්න ඇති වෙනව. ජීවිතය ඉතා ඉක්මණින් ඉදිරියට ඇදී යන යුගයකයි අප ජීවත් වන්නෙ. මේ යුගයේ සියලු ම අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දෙන්නට හැකි මිනිසුන් හැදීමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ මූලික දර්ශනය.

මේ සඳහා කළ යුතු බොහෝ දේ තියෙනව. වෙනස් වන ලෝකයට ගැලැපෙන ආකාරයට විෂය මාලා සකස් කළ යුතුයි. පාසල්වල උගන්වන සමහර විෂයමාලා සුද්දන් ගෙ කාලෙ හදපුව. ඒව අවුරුදු 100ක් 150ක් පැරැණියි. විශාල ලෙස වෙනස් වෙන ලෝකයට ගැලැපෙන පරිදි නව විෂය මාලා දැනට මත් සකස් කරල ඉවරයි.

මේ සඳහා මා පත් කෙරුව ජනාධිපති කාර්ය සාධක බලකායක්. අධ්‍යාපන අමාත්‍යාංශයේ, විශ්ව විද්‍යාලවල අධ්‍යාපන විශේෂඥයන්, ඒ වගේ ම වෙනත් බුද්ධිමතුන්, මේ සම්බන්ධයෙන් දැනුමත් තියෙන, උනන්දුවක් ආසාවක් ඇති අය, ඒ මගින් එකතු වෙලා ඉක්මනට කටයුතු කරල ඒ කාර්යය අවුරුදු දෙකක් ඇතුළත නිම කරල තියෙනව.

අනිත් පැත්තෙන් මේ නව විෂය මාලා අනුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන භෞතික සම්පත් සියල්ල ලබා දෙන්නටත් අප කටයුතු කරමින් සිටිනවා. උදාහරණ වශයෙන් කියනවා නම් පසුගිය කාලෙ පාසල්වල විද්‍යාගාර, විද්‍යා උපකරණ මෙන් ම විෂයයන් හරියාකාර ව උගන්වන්න පුළුවන් ගුරුවරුන් ද ප්‍රමාණවත් පරිදි දක්නට ලැබුණේ

නෑ. හුඟක් පාසල්වල, ලංකාවේ ප්‍රධාන නගරය වන කොළඹ නගරයේ ම ඇතැම් පාසල්වලට හදිසියේ මා ගිය අවස්ථාවල දැකල තියෙනව, පුටු මේස නැති ව ළමයින් බිම ඉඳ ගෙන ඉගෙන ගන්නව. දැන් අප ඒව ඔක්කොම සපුරල තියෙනව.

තව අත්‍යාවශ්‍ය දෙයක් තියෙනව. එය නැත්නම් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කවරදා වත් සාර්ථක වන්නේ නෑ. හරි පුහුණුවක් ලබපු කැපවීමක් ඇති ගුරුවරුන් පන්තියක් අපට අවශ්‍ය වෙනවා. 1977 දී, පසුගිය රජය රට භාර ගන්න වෙලාවෙ ගුරුවරුන් හිටියෙ අනූ තුන් දාහයි. 1994 අපිට රට භාර දෙන කොට ලක්ෂ දෙක යි. සංඛ්‍යාව වැඩි කරන්න ගුරු වෘත්තියට බඳවා ගත් සමහරුනට මූලික අධ්‍යාපන සුදුසුකම්වත් තිබුණේ නෑ. ඒ දක්වා මේ රටේ ගුරුවරුන් පාසල්වලට පත් කර යවන්නට පෙර අවුරුදු දෙකක ගුරු පුහුණුවක් ලබා දුන්නා. උගන්වනව කියන එක විශේෂ දෙයක්. කොයි තරම් ඥාණවන්ත වුණත්, කොයි තරම් අධ්‍යාපනයක් තිබුණත් ඉගැන්වීම පිළිබඳ විශේෂ පුහුණුවක් නැත්නම් ගුරුවරයකුට හොඳ ගුරුවරයෙක් වෙන්න බෑ. ඒත් අර ආකාරයට ගත් මූලික අධ්‍යාපන සුදුසුකම්වත් නොතිබුණු අයට අවුරුදු දෙකක තබා සති දෙකකවත් පුහුණුවක් නොදී පාසල්වලට ගෙනිහිල්ල අත ඇරිය. මේ තුළින් විශාල විනාශයක් වුණා අධ්‍යාපනයට.

පුහුණුවක් නොතිබුණා විතරක් නොවෙයි. මේ සමහර අය තුළ කැපවීමක් මෙන් ම විනයක් තිබුණෙත් නෑ. 'අප, මන්ත්‍රී තුමාගේ, ඇමැති තුමාගේ මිතිස්සු' කියාගෙන පැයක් දෙකක් පාසලේ ඉඳල ගෙදර යනව. ඔය වාගෙ මහ විනාශයක් තිබුණෙ.

දැන් අප ආරම්භ කරල තියෙනවා, ඉතා පුළුල්, ගැඹුරු ගුරු පුහුණුවක් ලබා දීමේ වැඩ පිළිවෙළක්. පහුගිය අවුරුදු තුන ඇතුළත එය ක්‍රියාත්මක වෙනව. මේ සඳහා ලෝක බැංකුවෙන් විශාල ණය ආධාර මුදලක් ලැබිල තියෙනව. ඒවා ආපසු ගෙවිය යුතු ණය වුණත් ඒවා වියදම් කරන්නේ අනාගතය වෙනුවෙන්.

ලෝකයේ රැකියාවල් විශාල ප්‍රමාණයක් තියෙනව. එහෙත් අපේ පාසල්වලින්, විශ්ව විද්‍යාලවලින් පිටවන දරුවන්ට ඒ රැකියා කරන්නට පුළුවන් විදිහේ පුහුණුවක් නෑ. කාර්මික අංශයත්, විද්‍යා අංශයත්, කලා අංශයත් විශ්ව විද්‍යාල තත්ත්වයට ම ගෙනල්ල අද සමාජයට සරිලන පුහුණුවක් ලබාදීමටත් කටයුතු කෙරෙනවා. ඒ භෞතික වශයෙන් බලාපොරොත්තු.

අතීත් පැත්තෙන් අද සමාජයේ ඇති වන සංකීර්ණ ප්‍රශ්නවලට පිළිතුරු හැටියට තුවක්කු බෝම්බ අතට ගන්නෙ නැතිව, ප්‍රජාතන්ත්‍රවාදී ව අතීත් අය සමඟ සංවාදයෙන්, ඒ අභියෝගවලට මුහුණ දෙන්නට හැකි ආත්ම ශක්තියක් ඇති සර්ව සම්පූර්ණ මිනිසුන් හදන්නයි අපේ අදහස.

ටී. එම්. ජී. චන්ද්‍රසේකර : ජනාධිපතිතුමියනි, සමහර විට අපට පෙනෙන විධියට නෙමෙයි, ළමයින්ට පෙනෙන්නෙ, දැනෙන්නෙ. ඔවුන්ට ම දැනෙන ඔවුන් ම කල්පනා කරන ප්‍රශ්න ගොඩක් ලැබී තිබෙනව. අපි ඔවුන්ට අවස්ථාව දෙමු.

ප්‍රියංකා දිල්හානි : ජනාධිපතිතුමියනි, දැනට තිබෙන අධ්‍යාපන ක්‍රමය අනුව අප ලොකු තරගයකට මුහුණ දීල ඉන්නෙ. නව අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක කළාට පස්සෙත් මේ තරගයට මුහුණ දෙන්නට වෙයි

ද ? එහෙම නැත්තම් මේ තරගය අඩු වෙයි ද ? වැඩි වෙයි ද කියල මා අහන්නෙ. ඒ වාගෙ ම ඔබතුමියට ඉදිරිපත් කරන්න කියල අපට ලැබිල තියෙන ලියුම්වලින් එකකුත් මම දැන් ඉදිරිපත් කරන්නම්. 'චන්ද්‍රිකා ඇන්ටි, මාගේ නම අනෝජ. ඇයි මේ ශිෂ්‍යත්වය නවත්වන්නේ ? ළමයි එක වසරෙ ඉඳන් ශිෂ්‍යත්ව පන්ති යනව. සෙල්ලම් කරන්න වෙලාවක් නෑ. පන්තිවලත් වැඩ, ගෙදරත් වැඩ. ඉස්කෝලෙ අරිල ඇවිත් ආපහු පන්ති. ඇන්ටිට බුදු සරණයි ! දෙවි පිහිටයි !

ජනාධිපතිනිය : ඇත්ත වශයෙන් ම තරගකාරී අධ්‍යාපනය දරුවන්ට බරක්. ඒ අනර්ථකාරී තරගය නැවැත්වීමත් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ එක ප්‍රධාන අරමුණක්.

විභාග නවත්වන්න බෑ. එක එක මට්ටමෙන් විභාග තියෙන්න ඕනෑ. විභාගය තුළින් තමයි අන්තිමට ඒ දරුවන්ගෙ දක්ෂතාවත් තක්සේරු කර ගන්නෙ. ඒත් විභාගය තරගයක් වෙන්න අවශ්‍ය නෑ. 'එයාට වැඩිය මං හොඳට කරන්න ඕනෑ' කියන තත්ත්වයට එන්න ඕනැ නෑ. 'එයා හොඳට කෙරුවත් නැතත් මට ප්‍රශ්නයක් නෑ මා හොඳට කරන්න ඕනැ' කියන අදහසයි අවශ්‍ය. අප විභාග කරන කාලෙ එහෙමයි. එහෙත් ඔය ගොල්ල කිව්ව වාගේ දැන් පාසල් අධ්‍යාපනය මුල ඉඳල අගට තරගයක්.

මුලින් ම පහ වසරෙ ශිෂ්‍යත්වයට. දෙමව්පියන් මැරී ගෙන, අනිත් මිනිස්සුන් පාගා ගෙන, අතේ තියෙන තුට්ටු දෙකත් වියදම් කරගෙන උදේ ඉඳල රෑ වෙනකම් ටියුෂන් පන්තිවලට අර ගෙන ගිහින් ළමයින්ට වද දෙනව. අප පැහැදිලිව ම තීන්දුවක් අරගෙන තියෙන්නෙ 5 වසර

ශිෂ්‍යත්ව විභාගය නතර කරන්න. හැබැයි ඒක අද හෙට නෙමෙයි ක්‍රියාත්මක කරන්නෙ, තව වසර තුනකින්.

5 වසර ශිෂ්‍යත්වය අවශ්‍ය ඇයි ? දක්ෂ ළමයින්ට හොඳ ම පාසල් ලබා ගැනීමටත්, ආර්ථික ප්‍රශ්න තියෙන අයට ශිෂ්‍යත්ව ආධාර මුදල් ලබා ගැනීමටත්. හොඳ ම ඉස්කෝල දෙමාපියන් ගෙත් දරුවන් ගෙත් තියෙන පරමාර්ථයක්. ගම් මට්ටමින් තියෙන පාසල් හොඳ මදි නිසායි, එහෙම අදහස් කරන්නෙ.

මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න අපි ආරම්භ කළේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක වෙන්නටත් ඉස්සර, මීට වසර 3කට කලින්. දැන් ඒක ක්‍රියාත්මක වෙමින් තියෙනව. ඒ යටතේ හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ම ජාතික පාසල් දෙක බැගින් දිවයින පුරා ජාතික පාසල් 300ක් ආරම්භ කරනව. දැනට මත් ඒ සඳහා පාසල් තෝරා ගෙන අවසන්. ඒ පාසල් 300 හොඳ ම ජාතික පාසල් මට්ටමට සංවර්ධනය කරනවා. ඒවාට අවශ්‍ය සියලු ම භෞතික පහසුකම් ලබා දෙනව. හොඳ ම ගුරුවරුන්, හොඳ ම විදුහල්පතිවරුන් ලබා දෙනව. මේවා දුන්නෙ නැත්නම් කවදාවත් පාසලක් හොඳ වෙන්නෙ නෑ. ඊට පස්සෙ හොඳ ම පාසලකට යන්න ශිෂ්‍යත්වයක් අවශ්‍ය වන්නෙ නෑ. ගමේ ම තියෙන හොඳ ම ජාතික පාසලට යන්න පුළුවන්.

හැබැයි සමහරුන් නගන ප්‍රශ්නයක් තමයි එතකොට ශිෂ්‍යත්ව ආධාර මුදල් නැති වෙයි ද? කියන එක. කිසිසේත් නැති වෙන්නෙ නෑ. ආධාර තවත් වැඩි කරන්නයි අපේ අදහස. ඒකට ශිෂ්‍යත්ව විභාගයක් අවශ්‍ය නෑ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වර්ෂයක් පාසා ශිෂ්‍යයන්ගේ අගැයීමක් සිදු කෙරෙනව. ඒ අනුව හොඳට ඉගෙන ගන්න

අය කවුද කියල ඒ ඉස්කෝලෙන් ඉබේට ම දැන ගන්න පුළුවන්.

දෙ වනුව දෙමාපියන් ගේ ආර්ථික තත්ත්වය නමැති සාධකය ද එයට එකතු කරනව. ආර්ථික ප්‍රශ්න තියෙන දෙමාපියන් ගෙ හොඳට ඉගෙන ගන්න දරුවන්ට තමයි ශිෂ්‍යත්ව ලැබෙන්නෙ. ඒකට විභාගයක් තියල ළමයින්ව මේ වාගේ තලන්න පෙලන්න ඕනෙ නෑ. අර පාසල් තුන්සීය අර තත්ත්වයට ගෙනාවට පස්සේ පහේ ශිෂ්‍යත්වෙ සඳහා තියෙන මහා තරගය අහෝසි කරන්නයි අදහස.

ඩිලාන් හේෂාන්ත : දේදුම්පිටියේ, දිනුෂ්ක සෙනෙවිරත්න කියන සර්, ඒ පළාතේ පාසලක ළමයින් ගේ ලිපියක් අපට ඉදිරිපත් කරල තියෙනව.

අතිගරු ජනාධිපතිතුමිය වෙත, අපි ගමේ පාසලක ඉගෙන ගන්නා ළමයි. නගරයේ ලොකු පාසල්වලට තියෙන පහසුකම් කිසිවක් අපට නැහැ. ඉංග්‍රීසි අනිවාර්ය කරනව කියල ආරංචියි. නගරයේ ළමයින්ට නම් පළමු වසරේ ඉඳල ම ඉංග්‍රීසි උගන්වනව. සාමාන්‍ය පෙළටවත් ඉංග්‍රීසි උගන්වන්න ගුරුවරුන් අපට නැහැ. ඉංග්‍රීසි අහගන්නත් ගමේ කෙනෙක් නැහැ. පළමු වසරේ සිට ම ඉංග්‍රීසි ඉගෙන ගන්න අපත් ආසයි. ටී. වී. එකේ ඩිස්කවරි පෙන්නුවට අපට ඉංග්‍රීසි තේරෙන්නෙ නැති නිසා හරි දුකෙන් ඉන්නෙ. ගමේ පාසල්වලටත් පළමු වසරේ සිට ම ඉංග්‍රීසි උගන්වන්න ගුරුවරුන් ලබා දෙන්න. ඒ වගේ ම අපත් කැමැතියි පරිගණක ඉගෙන ගන්න. හැම දෙයක් ම තවමත් නගරයට විතරයි ලැබෙන්නෙ. ගමේ ඉපදීම කරුමයක් නොවන්නට මබ තුමිය උදව් කරන්න.

ජනාධිපතිතුමියනි, මාත් බිබිල ප්‍රදේශයේ කෙනෙක් හින්ද මාත් අත් දැකීමෙන් ම දන්නව අපේ පළාතේ පාසල්වල තියෙන ගුරු හිඟය ගැන. පිට පළාත්වලින් එන ගුරුවරුන් මාස 6ක් අවුරුද්දක් වගේ කාලයක් රැඳිල ඉඳල මාරුවක් ලබා ගෙන යනව. තව ගුරුවරයෙක් එන්න තව මාස 6ක් වගේ කාලයක් යනව. මේ ප්‍රශ්නවලට ඔබතුමිය ලබා දෙන විසඳුම් මොනව ද ?

ජනපතිතිය : ඉස්සෙල්ලා ප්‍රශ්නයෙන් අපි පටන් ගම්මු. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ යටතේ සියලු ම පාසල්වල පළමු වසරේ ඉඳල ම ඉංග්‍රීසි උගන්වනව. ඒ වැඩ පිළිවෙළ අත්හදා බැලීමක් වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ 98 ජනවාරි 1 දා ඉඳල ආරම්භ වුණා. 99 ජනවාරි 1 දා ඉඳල එය මුළු ලංකාවෙ ම ක්‍රියාත්මක වෙනව.

දැනට ඉන්න ඉංග්‍රීසි ගුරුවරුන්ගෙන් සමහර අයගෙ ඉංග්‍රීසි දැනුම මදි. මේ අවුරුද්දේ ලංකාවෙ හැම දිස්ත්‍රික්කයක ම ඉන්න ගුරුවරුන්ට විශේෂ පුහුණුවක් ඒ නිසා ලබා දීල තියෙනවා. ඒ අනුව නව විෂය මාලා අනුව කටයුතු කරන්න පුළුවන් වෙනව. අලුත් වැඩ පිළිවෙළ යටතේ ඉංග්‍රීසි පිළිබඳ ව ප්‍රායෝගික දැනුමයි ලබා දෙන්නෙ. ඒ වාගෙ ම මැදක් හරියෙන්, සාමාන්‍ය පෙළට උසස් පෙළට ඊළඟට පටන් ගන්නව. මේ විදියට වසරෙන් වසර පන්තියෙන් පන්තියට ඉදිරියට ගියා ම අවුරුදු 5ක් යන කොට සියලු ම පන්තිවල නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ ක්‍රියාත්මකයි. බිබිලටත් රට හැම තැනට මත් මේ වැඩපිළිවෙළ එක හා සමාන ව ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. දැනට ඒ වැඩ පිළිවෙළ යොදලා තිබෙනවා.

එතකොට ගුරුවරු ඇවිල්ල යන එක ගැන ඩිලාන් අහපු ප්‍රශ්නය.

අප තීන්දුවක් අරගෙන තිබෙනවා ජනවාරියෙ ඉඳල ගුරුවරයෙක් මාරු කරන්නෙ වසර 3කට සැරයක් විතරයි කියල. නෑ දෑ කම්, මිත්‍රකම්, පාක්ෂිකකම් කියා ගෙන ආවට හරි යන්නෙ නෑ. ඒ වාගේ ම වසර 3කට 4කට සැරයක් අනිවාර්යයෙන් ම ගුරුවරුන්ව මාරු කරනව. දැන් තත්ත්වය අනුව හොඳ තැනක් අල්ල ගත්ත ම අවුරුදු 15ක් වුණත් එතන ම ඉන්නව. වෙන කෙනෙකුට එතැනට එන්න දෙන්නෙත් නෑ. මේ ක්‍රමයෙන් හැමෝට ම අවස්ථාවක් ලැබෙනව ලේසි පාඩු ප්‍රදේශයක් ලබා ගන්න. ඈත ප්‍රදේශවලත් ජාතික පාසල් 300 වැඩපිළිවෙළ යටතේ හොඳ පාසල් ඇති වුණාම ඒවට යන ගුරුවරු ආපසු එන්න බලන එකකුත් නෑ.

ප්‍රියංකා දිල්හානි : ජනාධිපතිතුමියනි, ඔබතුමිය පරිගණක අධ්‍යාපනය ගැන සඳහන් කළා. පරිගණක අධ්‍යාපනය ගැන ප්‍රශ්නයක් ලැබිල තිබෙනවා, අනුලා විදුහලේ නිලන්ති සොයුරිය ගෙන්. ජනාධිපති තුමියනි, හැම දෙනා ම තොරතුරු තාක්ෂණය ගැන කියනව. ඒ වුණාට අපට පාසලේ දී පරිගණක ගැන උගන්වන්නේ නෑ. අපත් ආසයි ඉගෙන ගන්න. ඇයි අපට උගන්වන්නෙ නැත්තෙ ?

ජනපතිනිය : නව වැඩ පිළිවෙළ යටතේ හැම පාසලකම පරිගණක ය පිළිබඳ දැනුම ප්‍රාථමික පන්තිවල ඉඳල ම ලබා දෙනව.

ටී. එම්. ජී. චන්ද්‍රසේකර : ඩිලාන්ලගෙ වගේ ඈත ප්‍රදේශවල ළමයි තාම පරිගණකයක් දැකලවත් නෑ.

ප්‍රියංකා දිල්හානි : ගම්වල ඉන්න පරිගණකයක් දැකපුවත් නැති සොයුරු සොයුරියනට 21 වන සිය වසට මුහුණ දීම ගැටළුවක් වෙනවා.

ජනපතිනිය : නව සිය වස ආරම්භ වන දෙදාස් එක් වැනි වසරෙ දී අප බලාපොරොත්තු වෙනව හැම පාසලකට ම පරිගණක ලබා දීල පරිගණක අධ්‍යාපනය ආරම්භ කරන්න. දැන් අපි හුඟක් පසු පසින් ඉන්නෙ. හරි නම් මෙලහකට මේව ඔක්කොම කෙරිල තියෙන්න ඕනෑ.

දුරකථනය මගින් ප්‍රශ්නයක් : මගේ නම ? ඉගෙනුම ලබන්නෙ නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයේ. ගරු ජනාධිපතිතුමිය ගෙන් මට දැන ගැනීමට අවශ්‍ය හැම පාසලක ම ද්‍රවිඩ භාෂාව උගන්වන්නේ නැත්තේ ඇයි කියල.

ජනපතිනිය : ඇත්ත වශයෙන් ම ඒකත් අපේ නව වැඩ පිළිවෙළේ එක කොටසක්. 1994 අගෝස්තු මාසයේ අපේ රජය බලයට ආපු ගමන් ම මා උත්සාහ කරපු දෙයක් තමයි ඉංග්‍රීසි භාෂාව හැම දෙනාට ම උගන්වන ගමන් ම සිංහල ළමයින්ට දෙමළත් දෙමළ ළමයින්ට සිංහලත් උගන්වන්න. ඒත් දෙමළ ගුරු හිඟයක් තිබුණ. පසුගිය රජය කාලෙ දෙමළ ගුරුවරුන් බඳවා ගෙන තිබුණෙ නෑ. ඒ අඩු පාඩු අප දැන් සම්පූර්ණ කර ගෙන තිබෙන නිසා 99 ජනවාරි මාසෙ ඉඳල ඒක කෙරෙනව.

දුරකථන මගින් ප්‍රශ්නයක් : නම ඉමල්කා තෙන්නකෝන්. නුවරින් කතා කරන්නේ. පළ වෙනි ප්‍රශ්නය, උසස් පෙළ නව විෂය නිර්දේශය ඉගැන්වීම පිළිබඳ ගුරුවරුන් ගේ සේවා අගැයීමක් සිදු වේ ද ? දෙවැනි ප්‍රශ්නය : උසස් පෙළ නව විෂය නිර්දේශය යටතේ උගන්වන ගුරුවරුන්ගෙන් අවශ්‍ය සහයෝගය ශිෂ්‍යයකුට නොලැබේ යයි හැඟේ නම් ඒ ශිෂ්‍යයාට ඒ පිළිබඳ ගත හැකි ක්‍රියා මාර්ගය කුමක් ද ?

ප්‍රියංකා දිල්හානි : අපටත් ගොඩක් ප්‍රශ්න ඇවිල්ල තියෙනව. ඉන් එකක් උසස් පෙළ නව නිර්දේශ ගැන. නියමිත විෂයයන් තුනට අමතරව අභියෝගතා පරීක්ෂණයකුත් තියෙනව කියල අප දන්නව. ඉතිං අර විෂයයන් තුනට අමතරව අභියෝගතා ප්‍රශ්න පත්තරය සඳහාත් ටියුෂන් පන්ති දැනට ම පටන් අරන්. මේ ගැනත් කියන්න යම් අදහසක් ඔබ තුමියට තියෙනව ද ?

ටී. එම්. ජී. චන්ද්‍රසේකර : ඒ කියන්නෙ දැන් මුල් අරමුණෙන් ම පිට පැනල. ටියුෂන් වළක්වන්න ආරම්භ කරපු දේකටත් ටියුෂන් ඇතුල් වෙලා. මේ පිළිබඳ ව සිසුන්ට ලොකු බයක් තියෙනවා.

ජනපතිනිය : නොතේරෙන දෙයක් ගැන ඉඳ හිට ටියුෂන් පන්තියකට යන එක එකක්. එහෙත් පාසලේ උගන්වන හැම දේට ම ටියුෂන් පන්ති යන එක තව එකක්. ටියුෂන් පන්තියට එන්න මම උගන්වන්නම් කියන තත්ත්වය නැති වෙන්න නම් තව අවුරුදු 3ක් විතර යයි.

නව විෂය මාලා අනුව සිසුන්ට ටියුෂන් පන්තියකට යන්න අවශ්‍ය නොවන විදියට උගැන්වීමේ ක්‍රමත් වෙනස් වෙනව. මෙතෙක් කල් තිබුණෙ යල් පැන ගිය ක්‍රම. ගුරුවරයා බෝඩ් එකේ ලියනව, නැත්නම් කියවනව, අපත් ලියා ගන්නව, කට පාඩම් කර ගන්නව. හරියට තේරෙන්නෙ නෑ. තේරුම් කරන්නෙත් නෑ. නව ක්‍රමය ඊට වඩා වෙනස්, ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රම උපයෝගි කර ගන්නව. ඒ වාගේ ම උගන්වන හැටිත් හැම ගුරුවරයෙකුට ම පුහුණු කරනව. මේව දැන් ම ඉඳල ම ක්‍රියාත්මක වෙනව.

මීට අමතර ව ගුරුවරුන් තුළත් ආකල්පමය විප්ලවයක් ඇති කළ යුතුයි. අප ඉස්කෝලෙ යන කාලෙ පාසලේ කියා දුන් යම් දෙයක් තේරුණේ නැත්නම් ඒ ගුරුවරය පාසල් වෙලාවෙන් පස්සෙ ඉඳල වෙන ම කියල දෙනව. ඒකට වෙනම පඩි ගෙවන්නෙ නෑ. ජාත්‍යන්තර පාසල්වල ඒ ක්‍රමය තව ම තියෙනවා. ඒ ගුරුවරු පන්තියේ දී යමක් නොතේරුණ ළමයකුට පාසල් වෙලාවෙන් පස්සෙ වෙන ම කියල දෙනව. ඒ අයට හොඳ පඩි ගෙවනව.

ගුරුවරුනට තිබුණෙ ඉතා ම අඩු පඩියක්. ගුරුවරයාගේ වගකීම විශාල නිසා, අධ්‍යාපනයට අප ඒ තරම් ම තැනක් දෙන නිසා, යුද්ධයක් කර කරත් ගුරු වැටුප් දෙගුණ කෙරුව. සල්ලි තිබුණට නෙමෙයි. අප ලෑස්තියි තවත් පඩි වැඩි කරන්න. හැබැයි පාසලේ හරියට වැඩ කරන්න ඕනැ. අනිත් පැත්තෙන් ටියුෂන් පන්ති නවත්වන්න වෙනව.

ටී. එම්. පී. චන්ද්‍රසේකර : මා හිතනව ජනාධිපති තුමියනි, පසුගිය කාලය තුළ ළමයින් වෙනුවෙන් යෝජනා කළ, ක්‍රියාත්මක වෙන හා ඉටු කළ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනව. ඉන් ළමා අපචාර හා ළමා ආරක්ෂාව ඉතා වැදගත් වෙනවා. ඒ ගැන ප්‍රශ්නත් ගොඩාක් ලැබිල තියෙනව.

ප්‍රියංකා දිල්හානි : ළමා අපචාර හා ළමා ආරක්ෂාව පිළිබඳ ව නීති සම්පාදනය වෙලා තිබුණත් ඒවා ක්‍රියාත්මක නොවන බවයි පෙන්නෙ. ඒ ගැන ඔබ තුමිය ගන්න පියවර මොනව ද ?

ජනපතිනිය : නීති සම්පාදනය වුණේ ඊයෙ පෙරේදා, ළමා අපචාර සම්බන්ධව මා පත් කළා ජනාධිපති කාර්ය සාධක බලකායක්.

මේක මා අලුතෙන් පටන් ගත් දෙයක්. හැම විෂයයක් පිළිබඳව ම පත් කළ ඒවා ඉතාමත් සාර්ථකයි. මේ කාර්ය සාධක බලකාය වසර 2ක් යන්නට ඉස්සෙල්ල, සියලුම කරුණු හොයල බලල යෝජනා ඉදිරිපත් කළා. ඒවා කැබිනට් මණ්ඩලයෙන් අනුමත වුණාට පස්සෙ, නීති හදල පාර්ලිමේන්තුවෙන් සම්මත කළා. දැන් මාසයකට විතර ඉස්සෙල්ලයි ඒවා සම්මත වුණේ.

ඒ අනුව ළමා ආරක්ෂක අධිකාරියක් පිහිටුවනවා. මුළු ආසියාවෙන් ම මෙ වැනි ළමා ආරක්ෂක අධිකාරියක් පිහිටුවන පළමු වන රට, මා හිතන්නෙ, ශ්‍රී ලංකාව. පනත අනුව එ අධිකාරියට හුඟක් බලතල ලබා දීල තියෙනව. පොලීසියෙත් විශේෂ ඒකකයක් ඒ අනුව හැදුව. ගුරුවරුන්, විශ්ව විද්‍යාල, රාජ්‍ය නොවන සංවිධාන, විද්වතුන්, බුද්ධිමතුන් සම්බන්ධ කරගෙන ලංකාව පුරා ම ළමා ආරක්ෂක කමිටු පිහිටුවනව. එතකොට තමයි මේක හරියට ම ක්‍රියාත්මක වෙන්නෙ.

ඒ වගෙ ම දැනට ම එක දෙයක් පිහිටුවල තියෙනව. ඒ කියන්නේ 'හොට්ලයින්' එකක් හෙවත් විශේෂ දුරකතනයක්. ඒ දුරකතන අංකය මේ සඳහා ම වෙන් කරල තියෙන්නෙ. කොතැන හරි දරුවෙක් කරදරයකට අපචාරයකට ගොදුරු වුණොත් මේ දුරකතන අංකයට කෙලින් ම කතා කරල කියන්න පුළුවන්. එතකොට ඒ වෙලේම ඒ ගැන පොලීසියට දැනුම් දෙනව. මේකත් ආසියාවේ පළමු වන වතාවට සිදු කළ දෙයක්.

ටී. එම්. ජී. චන්ද්‍රසේකර : ජනාධිපති තුමියනි, දුරකථනයක් නැති ප්‍රදේශයක කෙනකුට ඒ වගෙ දෙයක් දැනුම් දෙන්න ස්ථානයක් තියෙනව ද ?

ජනපතිනිය : ළමා අධිකාරිය හරියට ක්‍රියාත්මක වුණා ම හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම කමිටු පිහිටුවන්න පුළුවන්. එතකොට ටෙලිෆෝනයක් නැති කෙනකුට පයින් දුවල ගිහින් වුණත් පැමිණිල්ලක් කරන්න පුළුවන්.

ප්‍රියංකා දිල්හානි : ජනාධිපති තුමියනි, ජනමාධ්‍යවලින් ළමා මනසට නොගැලපෙන දේවල් දක්නට ලැබෙනවයි කියල අපට ලිපි කිපයක් ලැබිය තියෙනව. රූපවාහිනි, කාටූන්, ටෙලි නාට්‍ය හා වෙනත් වැඩ සටහන්වල ළමා මනස විකෘති වන ආකාරයේ අසභ්‍ය වූ දර්ශන දකින්න ලැබෙනවා. ජනමාධ්‍ය නිදහසත් රැක ගෙන ළමා මනසට නො ගැලපෙන දේවල් විකාශය නොවන්නට යම් කිසි පාලනයක් හෝ වාරණයක් හෝ කරන්න පුළුවන් ද ?

ජනපතිනිය : පුළුවන්. සිනමාව සම්බන්ධයෙන් නම් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයක් තියෙනව. ඒකෙ අනුමතිය යටතේ තමයි යමක් පෙන්නන්න පුළුවන්. ඒත් රූපවාහිනි හා ගුවන් විදුලි මාධ්‍යය සඳහා රඟුම් පාලක මණ්ඩල පනත අදාළ නෑ. ඒ නිසා ඕනෑ දෙයක් පෙන්නන්න පුළුවන්.

ඒ වුණත් මේ රූපවාහිනි හා ගුවන් විදුලි ආයතන සඳහා අවසර ලබා ගන්නා විට යම් ආචාර ධර්ම පද්ධතියකට එකඟතාව පළ කරල අස්සන් කරන්න ඕනෑ. ඒව අස්සන් කළාට, මේ ගොල්ල අර සල්ලිවලට තියෙන පෙරේතකමට ඕනෑ දෙයක් පෙන්නනව.

සියළු ම විද්‍යුත් මාධ්‍යයන් ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය වැනි දේක සුපරීක්ෂණය යටතට නීත්‍යානුකූලව ගැනීම ගැන අප දැන් සලකා බලා ගෙන යනව.

වි. එම්. ජී. චන්ද්‍රසේකර : රූපවාහිනී පනත යටතේ තියෙන නීතිවත් ක්‍රියාත්මක නොවන තත්ත්වය තියෙන්නෙ.

ජනපතිනිය : රජයේ විද්‍යුත් මාධ්‍ය ඇරෙන්න අනිත් අය කිසිසේත් ඒවා පිළිපදින්නේ නෑ. ඒ අයට මාත් ඇමැතිතුමාත් පෞද්ගලිකවත් කරුණු කියලත් තියෙනවා. එත් ඒව එච්චර දුරට පිළිපදින්නෙ නෑ.

ඒත් එක දෙයක් ගැන කියන්න සන්තෝෂයි. ළමා අපචාර පිළිබඳ කමිටුව පත් කළාට පස්සෙ ඒ කමිටුව මේ පෞද්ගලික විද්‍යුත් මාධ්‍යවලින් ඉල්ලීමක් කළා මෙවැනි දේවල් ප්‍රදර්ශනය කරන්න එපා කියල. ඒ ඉල්ලීම් පිළි අරගෙන දැන් බොහොම පරස්සමින් විකාශන කරන්නෙ.

දුරකථනය මගින් ප්‍රශ්නයක් : මා ගේ නම චමත්කා නලිනී ජයවර්ධන. මා ඉන්නෙ දෙපාතම, පන්නිපිටියෙ. නොයෙක් හේතු නිසා දෙ මාපියන් අහිමි වූ ළමයින් විශාල පිරිසක් අපේ රටේ ළමා නිවාසවල ඉන්නව. අප වාගේ ම අහිංසක මේ අයියලා, අක්කලා, නංගිලා, මල්ලිලා වෙනුවෙන් මෙතා වාගේ වැඩ පිළිවෙලක් ද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙන්නෙ. ?

ජනපතිනිය : අපේ රටේ ළමා නිවාස, මහළු නිවාස සමාජ සේවා අමාත්‍යාංශයෙන් පරිවාස දෙපාර්තමේන්තුවෙන් පාලනය කරන්නෙ. මේවායේ තත්ත්වය සතුටුදායක නෑ. හුඟක් දූෂණ සිද්ධ වෙනව. ළමයින්ට දෙන ආහාර පවා ඒවා පාලනය කරන අය හොරකම් කර ගෙන ගෙවල්වලට ගෙනියනව. ඒ තත්ත්වය මා පෞද්ගලිකව ම දන්නව.

හුහක් ඉස්සර ඉඳල ම මා වැඩි හරියක්ම දානෙ දෙන්නෙ ළමා නිවාසවලට. හැම වර්ෂයක් පාසා ම. ළමා නිවාස හොයා ගෙන ගිහිල්ල උදව් කරනවා.

ලංකාවෙ පළමු වැනි වතාවට අප පිහිටුවල තියෙනව සමාජ සේවා සඳහා වෙනම ම අමාත්‍යාංශයක්. ඉස්සර සමාජ සේවා විෂයය එච්චර ගණන් ගත්ත එකක් නෙවෙයි. කාගෙ හරි ඇමැතියකුගේ විෂයයකට පස්සෙන් තිකං අමුණනවා. දැන් එහෙම නෙවෙයි. ඒ සඳහා වෙනම ඇමති කෙනෙක් පස්සෙන් ඉන්නව. දැන් මේවා එකින් එක හොයා ගෙන යනව. අඩු පාඩු ගැන වාර්තාවක් හදා ගෙන යනව. ඒ නිසා මා හිතන හැටියට අපිට අර තත්ත්වය වෙනස් කරන්න පුළුවන්.

වී. එම්. ජී. චන්ද්‍රසේකර : ජනාධිපති තුමියනි, ඔබ තුමිය සාකච්ඡාව ආරම්භයේ දී ම සඳහන් කළා මත් කුඩු, මත් පැන් හා දුම්පානය පිළිබඳවත්, සිය දිවි නසා ගැනීම ගැනත්. මේ වා වැළැක්වීම සඳහා මොන වගේ පියවරක් ද දැන් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින්නෙ?

ජනපතිනිය : මත් කුඩු නම් වෙන ම ම විෂයයක්. ඒ සම්බන්ධව තිබෙන නීති රීති තද මදි. අප සංශෝධනය කරන්න යනව, ලබා දෙන දඩුවම් දැනට වැඩිය හුඟක් තද කරන්න.

මත්කුඩු සම්බන්ධයෙන් කටයුතු කරන්න ආරක්ෂක ඇමති හැටියට මගේ යටතේ ඒ සඳහා අධිකාරියක් තියෙනව. නව පාලනයක් යටතේ නව අධ්‍යක්ෂවරුන් යටතේ දැන් වැඩ රාශියක් කර ගෙන යනව. ඒ ප්‍රමාණය මදි. තවත් මුදල් ඒකට ලබා දීල ඒ අංශය තවත් දියුණු කරන්න බලාපොරොත්තු වෙනව.

මත්පැන් සහ දුම්පානය පිළිබඳ ව මේ රටේ කිසිම වැඩ පිළිවෙළක් තිබුණේ නෑ: ඒත් ජනාධිපති කාර්ය සාධක බලකායෙන් දැන් අපිට හොඳ වැඩ පිළිවෙළක් යෝජනා කරල තියෙනව. නීතිමය පැත්තෙනුත්, අධ්‍යාපනික හා සමාජමය පැත්තෙනුත් නව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරෙනව. අවශ්‍ය නීති රීතිත් අළුතෙන් හදල තියෙනව.

ඒ වාගෙම දිවි නසා ගැනීම් ගැනත් නීතිමය මෙන් ම සමාජමය පැත්තෙන් වැඩ රාශියක් කරන්න කටයුතු කර ගෙන යනව.

ප්‍රියංකා දිල්හානි : ජනාධිපති තුමියනි, මේ රටේ සියළු ම ළමයින් වෙනුවෙන් මා දැන් ඔබ තුමියට ප්‍රශ්නයක් ඉදිරිපත් කරනව. අපට නම් ඕනෑ ම තැනක යන්න එන්න නිදහස තියෙනව. අපත් එක්ක නිදහසේ කතා කරන්න අපේ දෙමා පියන්ට කාල වේලාව තියෙනව. ඔබ තුමියටත් දරුවන් දෙන්නෙක් ඉන්නව. ඔබ තුමිය ඉතා කාර්ය බහුල නිසා ඒ අයගෙ ප්‍රශ්නය ඔබ තුමියට ඉදිරිපත් කරන්නත්, ඒ අය ගැන ඔබ තුමිය විසින් සොයා බලනු ලැබීමටත් කාලය අඩු ඇති නේ ද ? ඉතින් ඒ අනුව අපට ඇති නිදහසත් එක්ක සන්සන්දනාත්මකව ඔබ තුමිය ඒ අයව දකින්නෙ කොයි ආකාරයට ද ?

ජනපතිනිය : මා ගේ දරුවො දෙන්න මා කරන 'ජොබ්' එක අනුව විශාල වශයෙන් කැපවීම් කරනව.

රට පාලනය කිරීම විතරක් නෙවෙයි. විශාල වගකීමක් අප භාර ගත්තෙ. එක් පැත්තකින්, යුද්ධයත් ජනවාර්ගික ප්‍රශ්නයත් නිසා රට විනාශ වෙලා තිබුණේ. අනිත් පැත්තෙන් ආර්ථිකය විනාශ වෙලා.

කලින් ආණ්ඩුව වගෙ අත හෝද ගෙන ඉන්නෙ නැතුව මේ ප්‍රශ්නවලට අපි කෙළින් ම අත ගැහුව. යුද්ධය නිමා කොට සාමය ඇති කරන්න අපි ගෙනියන වැඩ පිළිවෙළ නිසා මා ගේත් දරුවන් ගේත් ජීවිතවලට විශාල තර්ජනයක් තියෙනවා. ඒ නිසා ඒ ළමයින් දෙන්නාට සාමාන්‍ය ජීවිතයක් නෑ. ඒ අයට නිදහසකුත් නෑ. සාමාන්‍ය පවුලක දරුවකුට තියෙන නිදහස, සතුට භුක්ති විඳින්න අවස්ථාවක් ඇත්ත වශයෙන් ම පහු ගිය වසර හතරෙම ඒ ගොල්ලන්ට ලැබුණෙ නෑ. ඒ අය මට ළඟදිත් කිව්ව වෙන මිනිස්සු නිදහස සඳහා යුද්ධ කරනව, මිනී මරනව. ඒත් අපට දේශපාලනය නිසා නිදහස නෑ කියල.

ඇත්ත වශයෙන් ම මා මවක් හැටියට හුඟක් කණගාටු වෙනව, දුක් වෙනව. ඒ අයගෙ වැරැද්දෙන් නෙමෙයි මේක වෙලා තියෙන්නෙ. මා භාර ගත්ත වගකීමෙන්.

මා දරුවන් වෙනුවෙන් හුඟාක් කාලය ගත කරපු කෙනෙක්. උගන්වන්න, පාඩම් ගන්න, කතා කරන්න, ඒ අයත් එක්ක නොයෙකුත් දේ කරන්න, ඒ ගොල්ලන්ගෙ අධ්‍යාපනය වෙනුවෙන්. ඒත් පහුගිය වසර හතරේ ඒ එකක්වත් කරන්න වෙලාව තිබුණේ නෑ. මා උදේ හත හමාරට වැඩ පටන් ගත්තම එකකොළහයි දොළහයි ඉවර වෙන් කොට. ඒ වෙලාවට ළමයි නිදි. උදේට ඇහැරවල, උදේට කෑම දීල ඉස්කෝලෙ යවන කොට විතරයි ඒ ගොල්ලන් දකින්නෙ, ඒ ගොල්ලන් එක්ක ගත කරන්න ලැබෙන්නෙ.

ඒත් මුල් කාලයෙ මා දරුවන් එක්ක හුඟක් ගත කරපු නිසා මා හිතන්නේ හොඳ මිනිසුන් හැටියට ඒ අයට හොඳ ශක්තිමත් පදනමක් ලැබිල තියෙනව. එක උදාහරණයක් කියන්න කැමැතියි. ලොකු අය

කතා කරන විදියට මා දරුවන් එක්ක හුඟක් දේවල් කතා කරනවා. මොකද ඒවා ඒ අයට ප්‍රයෝජනවත් වන නිසා. ඇත්ත වශයෙන් ම ළමා අපචාර පිළිබඳ වැඩ පිළිවෙළ ආරම්භ කරන්න මුල් වුණේ මේ ළමයි දෙන්නා කියපු කතාවක්. එක්තරා ඉරිදා පත්තරේක ලංකාවේ සිදු වන ළමා අපචාර පිළිබඳ හොඳ ලිපි පෙළක් පළ වුණා. මට මේ හැම දෙයක් ම කියවන්න වෙලාව නෑ. ප්‍රධාන ප්‍රවෘත්ති, විදේශ පුවත්, රටේ සිදුවන දේවල් පිළිබඳ පුවත් ආදිය තමයි කියවන්නෙ. අර ලිපි ඉරිදා දවස් තුනක් විතර පත්තරේ පළ වුණාට පස්සේ එක් ඉරිදා දිනක උදේ මේ අය කෑ ගහගෙන ඇවිල්ල මට කිව්ව, 'මේ රටේ මෙහෙම දේව් වෙන්න දෙන්න බෑ. මේව නවත්තන්න බැරිනම් ආණ්ඩුව තිබ්බ වැඩකුත් නෑ. අම්ම රටේ ජනාධිපති වෙලා වැඩකුත් නෑ. ඇයි මොනව හරි කරන්නෙ නැත්තෙ' කියල. ඇත්ත වශයෙන් ඒ වෙලාවෙ මට ලැජ්ජාවක් වගෙත් හිතුණ.

ඒ දවස්වල ළමා අපචාර නෙමෙයි, ප්‍රභාකරන්ගෙ අපචාර නවත්වන්නයි, විනාශ වෙලා තිබුණ ආර්ථිකය හදන්නයි අපේ කාලය, වෙලාව ගියෙ. තව පැය දෙකක් හරි දවසකට වැඩ කරල මේකත් කරන්න ඕනැ කියල හිතල පහුවදා ම, සඳුදා ම ඒ සම්බන්ධ වාර්තා ගෙන්වා ගෙන ඒ අනුව තමයි කාර්ය සාධක බලකාය පත් කරල වැඩ පටන් ගත්තෙ.

ටී. එම්. ජී. චන්ද්‍රසේකර : දැන් කාලය ගෙවී ගිහිල්ල. ප්‍රියංකා, ඔබේ සොහොයුරු සොහොයුරියන්ට මේ අවස්ථාවේ වෙන මොනවද කියන්න තියෙන්නෙ ?

ප්‍රියංකා දිල්හානි : ලිපි මගිනුත්, ෆැක්ස් මගිනුත් දුරකථන මගිනුත් අපට ප්‍රශ්න ගොඩක් ලැබුණා. ඒවායින් කිහිපයක් අපට

ඉදිරිපත් කරන්න පුළුවන් වුණා. අනිත් ප්‍රශ්න සියල්ල ම ජනාධිපතිතුමියගේ පෞද්ගලික අවධානයට යොමු කරනවා. ඒවාට අදාළ විසඳුම් ලැබෙයි කියල අප බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේ ම ලෝක ළමා දිනය වෙනුවෙන් පුංචි අපේ ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා ඔබගේ වටිනා කාලය කැප කිරීම වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ මුළු ළමා පරපුර වෙනුවෙන් ම, ජනාධිපති තුමියනි අප ඔබ තුමියට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේ ම අප අපේ අම්මලා කියන දේ විශ්වාස කරනව. ඔබ තුමියත් මවක් නිසා ඔබ තුමිය දුන් පිළිතුරු හා උපදෙස් සේරම අප ඒ ආකාරයෙන් ම විශ්වාස කරනවා.

ටී. එම්. ජී. චන්ද්‍රසේකර : බොහොම ස්තුතියි, ජනාධිපතිතුමියනි.

ජනපති : බොහොම ස්තුතියි, ප්‍රියංකටයි, ඩිලාන්ටයි, චන්ද්‍රසේකරටයි.



Cover - Anuhas Mahawatage

ප්‍රකාශන අංශය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව